සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය - I

10 ශ්‍රේණිය | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. අතීතයේ පටන් ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා යොදාගත් පාලන ක්‍රමයන්ට උදාහරණයක් වන්නේ,
(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි. (2) පැසිස්ට්වාදී පාලන ක්‍රමයයි.
(3) සමාජවාදී පාලන ක්‍රමයයි. (4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි.

02. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
(1) ගම් සභාවයි. (2) පුරවැසි සභාවයි.
(3) පුරවැසි අංගනයයි. (4) කාරියට්ඩ්ස් අංගනයයි.

03. 15 වන සියවසෙන් පසු යුරෝපයේ පැවතුනේ,
(1) කෘෂි ආර්ථික රටාවකි. (2) වානිජ ආර්ථික රටාවකි.
(3) වැඩවසම් ආර්ථික රටාවකි. (4) ඉඩම් බුක්තිය මත බැඳුනු ආර්ථික රටාවකි.

04. ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත්වීම සඳහා බලපාන කරුණක් වන්නේ,
(1) එයින් ජනතා නියෝජිතයින් අධික පිරිසක් තේරීපත්වන නිසාය.
(2) සියලුම නියෝජිතයින් මහජන කැමැත්ත මත තේරී පත්වන නිසාය.
(3) නීති සම්පාදනය ජනතා නියෝජිතයින් මගින් සිදුකරන නිසාය.
(4) සාකච්ඡා මාර්ගයෙන් තීරණවලට එළඹෙන නිසාය.

05. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලය පිහිටා ඇත්තේ,
(1) ජනාධිපති කෙරෙහිය. (2) පාර්ලිමේන්තුව කෙරෙහිය.
(3) අධිකරණය කෙරෙහිය. (4) ජනතාව කෙරෙහිය.

06. රටක පාලනය සඳහා යම් ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන පාලන බලය ලබා ගැනීමේ අරමුණ ඇතිව සංවිධානය වූ පුද්ගල කණ්ඩායම,
(1) බලපෑම් කණ්ඩායම් වේ. (2) සිවිල් සමාජය වේ.
(3) විරුද්ධ පක්ෂය වේ. (4) දේශපාලන පක්ෂ වේ.

07. ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීම සඳහා භාවිතයට ගැනෙන ප්‍රධාන නිර්ණායක දෙකක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) භූමිය හා වර්ග ප්‍රමානය. (2) භූමිය හා ජනගහනයයි.
(3) භූමිය හා ස්වාධිපත්‍යය බලයයි. (4) ජනගහනය හා ස්වාධිපත්‍යය බලයයි.

08. බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව,
(1) සමානාත්මතාවයයි. (2) නිදහසයි. (3) අයිතිවාසිකමයි. (4) ස්වාධීනත්වයයි.

09. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අයිතිවාසිකම් ලබා දීමේ අරමුණ වන්නේ,
(1) සමාජ සංවර්ධනය තුළින් පුද්ගල සංවර්ධනය ඇතිකිරීම.
(2) සමාජ සංවර්ධනය තුළින් පුද්ගල අභිවෘද්ධිය ඇතිකිරීම.
(3) පුද්ගල සංවර්ධනය තුළින් සමාජ අභිවෘද්ධිය ඇතිකිරීම.
(4) පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගතවිය යුතු කරුණු නිවැරදිව අඩංගු පිළිතුර තෝරන්න.
(1) සිරිත් විරිත් හා සම්ප්‍රදායන් (2) ආගමික විශ්වාස හා ඇදහිලි
(3) පුරවැසියා සතු මූලික අයිතිවාසිකම් (4) පුරවැසියා සතු කාර්ය භාරයන්

11. නිදහස් මාධ්‍ය මගින් ඉටුකළ යුතු වැදගත් කාර්යයක් වන්නේ,
(1) සාවද්‍ය තොරතුරු ජනතාව වෙත සැපයීමට වග බලා නොගැනීම.
(2) පවතින රජයට පක්ෂපාතීව කටයුතු කිරීම.
(3) සමාජයේ යහපැවැත්මට අහිතකර අන්දමට තොරතුරු සැපයීම.
(4) පාලකයන් පැසිස්ට්වාදී මාවතට යොමු කිරීම.

12. ක්‍රි.ව. 1948 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ අයිතිවාසිකම් හා සම්බන්ධ ලියවිල්ල වන්නේ,
(1) 1948 මූලික අයිතිවාසිකම් පිළිබඳ විශ්වාස ප්‍රකාශනයයි.
(2) 1948 මූලික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියයි.
(3) ආර්ථික, සමාජ, දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියයි.
(4) 1948 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.

13. නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) නීතියේ රැකවරණය පාලකයන්ට ඉහළ මට්ටමින් ලබාදීම.
(2) නීතියේ රැකවරණය පාලිතයන්ට ඉහළ මට්ටමින් ලබාදීම.
(3) පවතින නීතිය යටතේ වරදකරුවන්ට දඬුවම් පැමිණවීම.
(4) අතීතයට බලපාන ලෙස නීති පැනවීම.

14. රාජ්‍ය පිළිබඳ නිර්වචන ඉදිරිපත්කළ චින්තකයන් දෙදෙනෙක් නිවැරදිව අඩංගු පිළිතුර තෝරන්න.
(1) මහාචාර්ය ගානර් හා ඇරිස්ටෝටල් (2) ප්ලේටෝ හා ඇරිස්ටෝටල්
(3) ජේ. ආර්. ලවෙල් හා මහාචාර්ය ගානර් (4) සිලර් සහ මහාචාර්ය ගානර්

15. යුරෝපයේ බිහිවූ මුල්ම ජාතික රාජ්‍ය ප්‍රබල ජාතික රාජ්‍ය ලෙස නැගී සිටීමට හේතු දෙකක් අඩංගු පිළිතුරු තෝරන්න.

A - ජාතික ඒකාග්‍රතාවය
B - ධනවාදී ආර්ථිකය බිඳවැටීම
C - ජාතීන් සතුවූ නිර්මාණශීලී හැකියා
D - නොදියුණු ආර්ථික තත්වය

(1) AB (2) BC (3) AC (4) AD

16. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක බලය යන්නෙන් අදහස් කරන්නේ,
(1) රාජ්‍ය පාලනයේදී ජනාධිපතිට හිමිවන බලයයි.
(2) රාජ්‍ය පාලනයේදී පාර්ලිමේන්තුව සතුවන බලයයි.
(3) රාජ්‍ය පාලනයේදී අධිකරණය සතුවන බලයයි.
(4) රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යාමට රාජ්‍යයට ඇති හැකියාවයි.

17. බලය විමධ්‍යගත කිරීම ලෙස හඳුන්වන්නේ,
(1) මධ්‍යම ආණ්ඩුව සතු බලය ප්‍රාදේශීය පාලන ඒකක වෙත බෙදා දැක්වීමයි.
(2) මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීමයි.
(3) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල බෙදා දැක්වීමයි.
(4) ප්‍රාදේශීය පාලන ඒකකවලට වැඩි බලතල ප්‍රමාණයක් මධ්‍යම ආණ්ඩුව විසින් පවරා දී ඒවා ශක්තිමත් කිරීමයි.

18. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ව සඳහා තිබිය යුතු ගුණාංගයක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) සම්පත් අඩු ප්‍රාදේශීය රාජ්‍ය වලට එම ගැටළු විසදා ගැනීමේ වගකීම පැවරීම.
(2) මින් එක් එක් ප්‍රාන්ත තම අභිවෘද්ධිය තනිව සලසා ගැනීමට කටයුතු කිරීම.
(3) මධ්‍යම ආණ්ඩුවේ අපේක්ෂාවන් වෙනුවෙන් කටයුතු කිරීම.
(4) සියලු ජන කොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම.

19. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන්ට උදාහරණ අඩංගු පිළිතුර තෝරන්න.
(1) ලංකාව හා ඉන්දියාව (2) ඉන්දියාව හා ප්‍රංශය
(3) බ්‍රිතාන්‍ය හා ප්‍රංශය (4) ඇමරිකාව හා එංගලන්තය

20. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදුකරන නියෝජිතයා වන්නේ,
(1) ජනාධිපතිවරයා ය. (2) අගමැතිවරයා ය. (3) මහඇමතිවරයා ය. (4) ආණ්ඩුකාරවරයා ය.

21. පහත ප්‍රකාශවලින් ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න.

A - බදු පැනවීම හා එක්රැස් කිරීම.
B - පළාත් පාලනය මහාමාර්ග.
C - නිවාස ඉදිකිරීම.
D - මූල්‍ය කටයුතු.

(1) AB (2) BC (3) AC (4) AD

22. යහපාලනයේ පැවැත්ම සඳහා අගයකළ යුතු සමාජ හා සංස්කෘතික ගති ලක්ෂණය ඇතුළත් පිළිතුර වන්නේ,
(1) එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයට ගරු කිරීම.
(2) දේශපාලන නායකත්වයට ගරුකිරීම.
(3) විවිධ ජනවර්ග හා විවිධ ජනකණ්ඩායම් අතර විශ්වාසය තහවුරු කිරීමට කටයුතු කිරීම.
(4) ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම කිරීමට කටයුතු කිරීම.

23. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලන සමයේ ආර්ථික භෝග වගාවන් සඳහා ශ්‍රමිකයන් ගෙන්වා ගත්තේ,
(1) උතුරු ඉන්දියාවෙනි. (2) දකුණු ඉන්දියාවෙනි.
(3) මාලදිවයිනෙනි. (4) බංග්ලාදේශයෙනි.

24. යහපාලනය යනුවෙන් හඳුන්වන්නේ,
(1) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියකි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.
(4) මේ කිසිවක් නොවේ.

25. යහපාලනයේ මූලික ගුණාංගයක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) මාධ්‍ය, නිදහස වාරණයට ලක්කිරීම.
(2) රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
(3) නිලධාරීවාදය.
(4) ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

26. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන්,
(1) එකිනෙකා අතර අනවබෝධය ඇතිවේ.
(2) විවිධ ජනකණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය වේ.
(3) ආගමික හා සංස්කෘතික විවිධතා ඇතිවේ.
(4) නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමට හුරුවේ.

27. නූතන ජාතික රාජ්‍ය සංකල්පයේ අදහස වන්නේ,
(1) එක් රාජ්‍යයකට විවිධ ජාතීන් යන්නයි. (2) එක් ජාතියකට එක් රාජ්‍යයක් යන්නයි.
(3) එක් ජාතියකට විවිධ රාජ්‍ය යන්නයි. (4) විවිධ රාජ්‍යයන්ට විවිධ ජාතීන් යන්නයි.

28. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්,
(1) ගැටුම් ඇතිවීම වර්ධනය වේ.
(2) අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට අගරුවන ආකාරයට හැසිරීමට හුරු වේ.
(3) මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය හීනවේ.
(4) රටේ සංවර්ධනය පිළිබඳව පුද්ගලයන් එකට එක්වී කටයුතු කිරීමට පෙළඹේ.

29. රාජ්‍ය අංශයේ නිෂ්පාදනයක් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) දුරකතන සේවය සහ දුම්රිය සේවය. (2) අධ්‍යාපනය හා මංමාවත් ඉදිකිරීම.
(3) ඛණිජතෙල් නිෂ්පාදනය සහ දුම්රිය සේවය. (4) මංමාවත් ඉදිකිරීම හා ඇඟලුම් නිෂ්පාදනය.

- **පහත ප්‍රකාශන කියවා 30 හා 31 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - ආදායම් අසමාන ලෙස බෙදී යාම.
B - රාජ්‍ය සතු දේපල අයිතිය.
C - නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතුවීම.
D - ආර්ථිකය මධ්‍ය සැලසුම් මණ්ඩලයකින් මෙහෙයවීම.
E - තරගකාරී වෙළඳපලක් පැවතීම.
F - මූලික ආර්ථික ප්‍රශ්න පොදු යහපත උදෙසා විසඳීම.

30. ධනවාදී ආර්ථික ක්‍රමයක අඩංගු ලක්ෂණ වන්නේ මින් කුමක් ද?
(1) ABC (2) ACE (3) ACD (4) BDE

31. සමාජවාදී ආර්ථික ක්‍රමයක අඩංගු ලක්ෂණ වන්නේ මින් කුමක් ද?
(1) ABC (2) BCD (3) BDF (4) CEF

32. වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපල ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණයක් අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?
(1) රාජ්‍ය ව්‍යවසායන් දිරි ගැන්වීම.
(2) පොදු දේපල අයිතියට ඉඩහසර ලබාදීම.
(3) සහනාධාර හා මිල පාලන ක්‍රම දැඩි කිරීම.
(4) පාලන නීතිරීති සීමා අවම කිරීම.

33. 1977 ට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ දක්නට ලැබුනු විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම.
(2) ආනයන ආදේශන කර්මාන්ත ඇරඹීම.
(3) ආනයන අපනයන සීමා ලිහිල් කිරීම.
(4) අධ්‍යාපනය සඳහා නිළ ඇඳුම්, පෙළපොත් නොමිලේ ලබාදීම.

34. තිරසාර සංවර්ධනයේදී රටක් සැළකිලිමත් වන කරුණක් වන්නේ,
(1) සංවර්ධන කාර්යයන් සඳහා ජනතා සහභාගීත්වය අවම කිරීම.
(2) පරිසරය ආරක්ෂා කර ගැනීම.
(3) වර්තමාන සම්පත් වර්තමාන සමාජ සංවර්ධනය සඳහා උපරිම ලෙස භාවිතා කිරීම.
(4) අන්‍ය සංස්කෘතීන් පිළිබඳව වැඩි සැළකිල්ලක් නොදැක්වීම.

- **පහත ප්‍රකාශන කියවා 35 හා 36 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම.
B - නිෂ්පාදනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල්වීම.
C - බුද්ධි ගලනය වේගවත් වීම.
D - අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපලෙන් ඉවත් වීම.
E - දේශීය ළදරු කර්මාන්ත විනාශ වීම.
F - විදේශීය ණය හා ආධාර මත යැපීමට සිදුවීම.

35. ඉහත ප්‍රකාශවලින් ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවෙන් ඇතිවී තිබෙන ධනාත්මක බලපෑම් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) ABD (2) BCE (3) BDF (4) BEF

36. ඉහත ප්‍රකාශවලින් ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇතිවී තිබෙන ඍණාත්මක බලපෑම් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) ABC (2) CEF (3) BDF (4) BEF

37. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමු විය හැකි අංශ දෙකක් අඩංගු පිළිතුර තෝරන්න.

A - උපදේශනය
B - වැඩ කල් දැමීම
C - නිදහස්ව කටයුතු කිරීම
D - මනෝ විද්‍යාත්මක අභ්‍යාස

(1) AB (2) AD (3) AC (4) CD

38. ආගමික මතවාද නිසා ඇතිවූ ගැටුම් වලට උදාහරණයක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) මැදපෙරදිග අර්බුදය
(2) කුරුස යුද්ධය
(3) සෝමාලියා ඉතියෝපියා ගැටුම
(4) ඊශ්‍රායල හා පලස්තීන ගැටුම

39. ගැටුම් නිරාකරණය කිරීමේදී පුද්ගලයකු සතුවිය යුතු පුද්ගල ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) කරුණාව හා මෛත්‍රිය
(2) පක්ෂග්‍රාහී වීම.
(3) තම මතයේ දැඩිසේ රැඳී සිටීම.
(4) ජය පරාජය විඳ දරා ගැනීම.

40. ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම මගින්,
(1) මානසික ආතතිය උපරිම වේ.
(2) පුද්ගල මානසිකත්වය ඉහළයයි.
(3) ජාතික ඒකාබද්ධතාවය ගිලිහෙයි.
(4) දේශපාලන අස්ථාවරත්වය ඇතිවේ.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) i. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න.

ii. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

iii. නූතන රාජ්‍යවල මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම වර්ග දෙක ලියන්න.

iv. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසයෙන් නිදසුන් දෙකක් ලියන්න.

v. පළාත් සභාවල සංවෘත ලැයිස්තුවට අයත් බලතල දෙකක් ලියන්න.

vi. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් පවතින රටවලට උදාහරණ 02 ක් ලියන්න.

vii. යුරෝපයේ ජාතික රාජ්‍ය බිහිවීමට හේතු 2 ක් ලියන්න.

viii. පරිවර්තන ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ 02 ක් ලියන්න.

ix. ගෝලීකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න.

x. ගැටුම් වර්ග පුළුල්ලෙස බෙදා දැක්විය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර දෙක ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) i. පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප දෙකක් ලියන්න. (ල.02)

ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ල.05)

(03) i. නූතන ජාතික රාජ්‍යයේ ප්‍රධාන අංග දෙකක් ලියන්න. (ල.02)

ii. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. ආණ්ඩුවේ ප්‍රධාන ආයතන තුන නම් කර එකක් විස්තර කරන්න. (ල.05)

(04) i. නූතන රාජ්‍යවල බලයේ විවිධ ස්වරූප දෙකක් ලියන්න. (ල.02)

ii. නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට හේතු තුනක් ලියන්න. (ල.03)

iii. a. ඒකීය ආණ්ඩුක්‍රමයක වාසි දෙකක් ලියන්න. (ල.02)

b. ඒකීය ආණ්ඩුක්‍රමයක අවාසි තුනක් ලියන්න. (ල.03)

(05) i. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 02 ක් ලියන්න. (ල.02)

ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් ලියන්න. (ල.03)

iii. වර්තමානයේ සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති සාධක තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.05)

(06) i. ඕනෑම ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් ලියන්න. (ල.02)

ii. නිෂ්පාදන කාර්යයේදී හමුවන නිෂ්පාදන සාධක තුනක් ලියන්න. (ල.03)

iii. ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුන නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.05)

(07) i. රටවල් අතර ඇතිවන ගැටුම් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල.02)

ii. ඕනෑම සමාජයක ගැටුම් ඇතිවන මූල තුනක් ලියන්න. (ල.03)

iii. නූතන රාජ්‍යයන් ගැටුම් නිරාකරණය කිරීම සඳහා යොදාගන්නා ක්‍රම තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ල.05)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(2) | 4 -(4) | 5 -(4) | 6 -(4) | 7 -(2) | 8 -(2) | 9 -(3) | 10 -(3) |
| 11-(1) | 12 -(4) | 13 -(3) | 14 -(1) | 15 -(3) | 16 -(4) | 17 -(2) | 18 -(4) | 19 -(3) | 20 -(4) |
| 21-(4) | 22 -(3) | 23 -(2) | 24 -(1) | 25 -(4) | 26 -(4) | 27 -(2) | 28 -(4) | 29 -(3) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(2) | 34 -(2) | 35 -(1) | 36 -(2) | 37 -(2) | 38 -(2) | 39 -(1) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • සෘජු ප්‍රජාතන්ත්‍රවාදය • වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

ii. • ජනමත නියෝජනයට ඇති ඉඩකඩ පුළුල්වීම.
• අත්තනෝමතික පාලනයක් බිහිවීම වැලකීම.
• බහුවිධතාවය තුළින් එක්සත්බව ගොඩනැගීම ආදී....

iii. • ජනාධිපති ආණ්ඩුක්‍රම
• පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම

iv. • පණ්ඩුකාභය රජු ගම්භාර, ගාමිනි වැනි අය පත් කිරීම.
• පොළොන්නරු යුගයේ පරාක්‍රමබාහු රජු ප්‍රාදේශීය පාලකයන් පත්කිරීම.

v. • විදේශ කටයුතු
• ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන ආදී...

vi. ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය

vii. • රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
• පුනරුදය • විද්‍යාත්මක දැනුම වර්ධනය

viii. • ආර්ථික ලිහිල්කරණය
• පෞද්ගලික ව්‍යවසායකයන් දිරි ගැන්වීම

ix. • වැඩ ලෝකය පුළුල්වීම
• ගෝලීය වෙළඳපල පුළුල් වීම
• ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකිවීම... ආදී

x. • අභ්‍යන්තර ගැටුම්
• අන්තර්ජාතික ගැටුම්

(ලකුණු 2 × 10 = 20)

(02) i. ඒකපක්ෂ, ද්විපක්ෂ, බහුපක්ෂ (ල.02)

ii. • නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම
• සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම
• මැතිවරණ නීතිරීතිවලට අනුකූලව මැතිවරණය පැවැත්වීම.... ආදී, (ල.03)

iii. • ආණ්ඩු පක්ෂයේ යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදීම
• ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මක විවේචන ඉදිරිපත් කිරීම.
• වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියාකිරීම (කරුණු වලට 03 + විස්තරයට 02) (ල.05)

(03) i. භූමිය, ජනගහනය ආදී (ල.02)

ii. • එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
• භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය යන අංග හතරෙන් සමන්විත වීම.
• වෘත්තිය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම.... ආදී, (ල.03)

iii. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ (කරුණු වලට 03 + විස්තරයට 02) (ල.05)

(04) i. ආර්ථික බලය, සමාජ බලය, දේශපාලන බලය (ල.02)

ii. • ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමට
• රාජ්‍යයේ විශාලත්වය.
• විවිධත්වය තුළින් එක්සත් බව ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව. (ල.03)

iii. a. • ඉක්මනින් තීරණ ගත හැකිවීම.
• පරිපාලන ක්‍රමය රාජ්‍යයට පොදු එකක් වීම.
• ගැටුම් අවම වීම. (ල.02)

b. • පොදු ජාතිකත්වයක් ගොඩනගාගැනීම.
• පරිපාලන තීන්දු ගැනීම පහසු වීම.
• ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම. (ල.0)

(05) i. • විවිධ ජනවර්ග සිටීම
• විවිධ ආගම් තිබීම.... ආදී (ල.02)

ii. පිහිටීම, ආක්‍රමණ, සංක්‍රමණ ආදී (ල.03)

iii. • නිලධාරිවාදය, අල්ලස හා දූෂණය ඉහළ යාම.
• රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම..... ආදී තුනක් ලියා එකක් විස්තර කිරීම. (ල.05)

(06) i. • කුමක් කොපමණ නිපදවිය යුතුද?
• කෙසේ නිපදවිය යුතුද?..... ආදී (ල.02)

ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (ල.03)

iii. නිෂ්පාදනය බෙදාහැරීම පරිභෝජනය (තුනක් ලියා එකක් විස්තර කිරීම ල.05)

(07) i. • මතවාදී ගැටුම්
• යුධමය ගැටුම් (ල.02)

ii. වාර්ගිකත්වය, දේශපාලනය, අන්‍යාගමික මතවාද, සමාජ ආර්ථික තත්වය (ල.03)

iii. සමතකරණය, මැදහත්කරණය, උපදේශනය... ආදී තුනක් ලියා එකක් විස්තර කිරීම. (ල.05)